# ක්‍රිස්තියානි ධර්මය - 10 ශ්‍රේණිය
# දෙවන වාර පරීක්ෂණය - 2024

## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01). | ii | 11). | ii | 21). | i | 31). | ii |
| 02). | iv | 12). | i | 22). | iii | 32). | iii |
| 03). | i | 13). | ii | 23). | ii | 330. | ii |
| 04). | iii | 14). | i | 24). | iii | 34). | iv |
| 05). | iv | 15). | iv | 25). | ii | 35). | i |
| 06). | ii | 16). | iii | 26). | iv | 36). | iii |
| 07). | i | 17). | ii | 27). | ii | 37). | ii |
| 08). | iv | 18). | i | 28). | iii | 38). | i |
| 09). | ii | 19). | ii | 29). | iii | 39). | iii |
| 10). | iv | 20). | iii | 30). | iv | 40). | i |

### II කොටස

01. i) මෙසියස් වහන්සේගේ පැමිණීම, ජේසුස් වහන්සේ

ii) දෙවියන් වහන්සේ අප සමඟයි.

iii) තිබේරියස් විල, ගෙනසෙරෙත් විල

iv) ◆ මෙම උපත තුළින් දෙවි සමිඳාණෝ ජනතාවගේ විමුක්තිය සලසන බව.

◆ ජේසුතුමාගේ උපත තුළින් ජුදෙව් බලාපොරොත්තුව ඉටුවන බව

v) නියමිත පමණට වැඩියෙන් අය බදු අය නොකරන්න යනුයි.

vi) ◆ රටපුරා සුභ අස්න ප්‍රකාශවීම,

◆ දෙවියන් වහන්සේගේ නාමය තුළ රෝගීන් සුවය ලැබීම,

◆ දුෂ්ට ආත්ම යටත්වීම.

vii) ◆ ආබ්‍රහම්ගේ පුත්‍රත්වය - සාකෙවුස්

◆ තමා සන්තක මුදල් බෙදාදීම - ( ½ දිළින්දන්ටදීම, යමෙකුගෙන් අයුතු ලෙස ලබාගෙන ඇති මුදල් මෙන් හතර ගුණයක් ඒ තැනැත්තාට දීම )

viii) දකුණේ සිටි ජුදෙව්වන් ජනතාව විසින් උතුරේ සිටි සාමාජිකයන් ලෙස හැඳින්වූ තම සහෝදර ජනතාව '' අන්‍ය ජාතීන් හා මිශ්‍රවීම නිසා අපවිත්‍ර වූ '' ජන කොටසක් ලෙස සළකා පිළිකුල් කර කොන් කිරීම.

ix) ''සබත මිනසා උදෙසා මිස මිනිසා සබත උදෙසා නොවන බව'' යි.

x) ලිඛිත ව්‍යවස්ථාව භාවිතා කිරීම, දේවදූතයන් හා පුනරුජ්ජීවනය පිළි නොගැනීම.

02. i) ජේසුස් වහන්සේ විසින්, ධර්මදූත චාරිකා සඳහා පිටත්වගිය ධර්මදූතයන් උදෙසා, ඔවුන්ට උපදෙස් දුන් අවස්ථාවේදීය.

ii) ◆ චාම් දිවි පෙවත

◆ දෙවියන් වහන්සේ කෙරෙහි සම්පූර්ණ විශ්වාසය, රැඳීම ද සහිතව සේවයේ නියැලීම.

නිරන්තර යාච්ඤාව

(මීට අමතරව 10 ශ්‍රේණියේ පිටු අංක 33 පිළිතුරු සැහේ )

iii) ඉහත පිටු අංකයේ දැක්වෙන කරුණු දරුවන්ගේ ජීවිතය තුළින් විදහා පාමින් ලියා ඇති සියලු ගැළපෙන පිළිතුරු වලට ලකුණු පවරන්න.

03. i) ◆ ඔහු ජුදා මන්ත්‍රණ සභාවේ සාමාජිකයෙකු වුව ද, ජුදෙව් ක්‍රියා කලාප අනුමත නොකිරීම.

◆ ශ්‍රාවකයින් පවා ජේසුස් වහන්සේ නොහඳුනන බව කිමුත් අරිමාතියේ ජෝසෙප් ඉතා එඩිතරව එතුමාගේ මෘත දේහය ගෞරවාන්විතව තැන්පත් කිරීමට ඉල්ලා සිටීම.

ii) ◆ උන් වහන්සේට නපුර කළ අයට සමාව දානය කිරීම.

◆ ''පියාණනි, ඔවුන්ට කමා වුව මැනව, ඔවුන් කරන දෙය ඔවුහු නොදනිති. '' ලෙස පවසා කමාව දානය කිරීම.

◆ උන්වහන්සේ මේ ලෝකෙට වැඩිය මෙහෙවර නියමිත පරිදි අවසන් කිරීම.

iii) දරුවන් ලියා ඇති පිළිතුරු සඳහා ලකුණු පවරන්න.

04. i) දේව කැමැත්ත තේරුම් ගැනීම, දේව වචනය පිළිපැදීම.

ii) සාකෙවුස් සුව කිරීම, ලාදුරු රෝගියා සුව කිරීම, කුදු ස්ත්‍රිය සුව කිරීම.

iii) ''සාම යැදුම'' තුළින් දරුවන් ලියා ඇති කරුණුවලට අනුව ලකුණු පවරන්න.

05. i) අධිරාජ්‍යයාට බදු ගෙවීම සම්බන්ධ ප්‍රශ්නයේ දී මෙලෙස උන්වහන්සේ පැවසූ සේක. (10 ශ්‍රේණිය පිටුව 49, 50)

ii) ◆ උන්වහන්සේ කටවචනයෙන් අල්ලා ගැනීමට සිතූ මුත් එය නිශ්ඵලවීම.

◆ දේව රාජ්‍ය ලෞකික රාජ්‍යයකට කිසිසේත් සමාන කළ නොහැකි බව.

◆ දෙවියන් වහන්සේට දීම යනු අපගේ මුලු ජීවිතයම උන්වහන්සේට සේවය කිරීමයි.

iii) ◆ අපගේ මෙලොව දිවිය හා මරණින් මතු පැමිණෙන ජීවිතය ගැන අවබෝධය ලබාදීම.

◆ සැබෑ ප්‍රශ්න හා එසේ නොවන ඒවා නිවැරදිව හඳුනාගැනීමට.

◆ අවංක ලෙස පෙනී සිටින වංකයන්ගෙන් ප්‍රවේශම් වීමට.

◆ අපගේ ඇදහිල්ල අභියෝගයට ලක්නොවන පිණිස ක්‍රියා කිරීමට.

◆ ජේසුස් වහන්සේ දෙවිඳුන් බව විශ්වාස කිරීමට.

06. i) ◆ ආගමික නායකයින් තම පෞද්ගලික අරමුණු ඉටුකර ගැනීමට නීතිරීති යොදා වෙළඳාම් වල නියැලීම.

◆ ආගම මුවාවෙන් ජනතාව සූරාකෑම.

ii) ◆ දේවමාලිගය පවිත්‍ර කිරීමට කටයුතු කිරීම.

◆ කස පහර ගසා, වෙළදාම් කරමින් සිටි මේස ආදිය විනාශ කිරීම, තම දේව ගෘහය ආරක්ෂා කිරීම හා පිරිසිදු කිරීමට කටයුතු කිරීම.

◆ තම මෙහෙවරේ අවසාන කාලය ගතවන බව තේරුම් ගත් ජේසුතුමා ජෙරුසලම ගැන හඬා කම්පාවීම.

(ශු.ලුක් - 19: 45-48 )

iii) ◆ එහෙත්, ඔබ එය හොරුන්ගේ ගුහාවක් කර තිබේ ය. (ලකුණු 2 ප්‍රදානය කරන්න.)

◆ ළමුන් ලියා ඇති කරුණු සඳහා ලකුණු පවරන්න. (ලකුණු 3 ක් ලෙස ප්‍රදානය කරන්න.)

07. i) **අන්තිම රාත්‍රී භෝජන සංග්‍රහය.**

◆ ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල් බවින් මුදවා ගනු ලැබූ සිදුවීම ස්තුතිවන්තව සිහිපත් කළ පාස්කු මංගල්‍යය ජේසුතුමා අර්ථාන්විතව සැමරීමට තීරණය කිරීම.

◆ ජේසුතුමා තම ශ්‍රාවකයින් සමග එය සිදු කිරීමට සහභාගීත්වයේ ආදර්ශය ක්‍රියාත්මක කිරීම.

◆ රොටී ගෙන ස්තුති කොට, කඩා '' ඔබ උදෙසා දෙනු ලබන මාගේ ශරීරය මේය. මා සිහිකිරීම පිණිස මෙය සිදුකරන්න. '' පැවසූ සේක.

◆ කුසලාන ගෙන '' මේ කුසලාන ඔබ අදෙසා වගුරවනු ලබන මාගේ රුධිරයෙන් කළ නව ගිවිසුමය. ''

◆ එකම රොටිය, එකට කඩා අනුභව කිරීම හා එකම කුසලානයෙන් පානය කිරීම තුළින් සහෝදරත්වය නොකඩවා පවත්වා ගැනීමේ අවශ්‍යතාවය පෙන්වූ සේක.

(10 ශ්‍රේණිය පෙළ පොතේ පිටු අංක 54, 55 ට අනුව ළමුන් ලියා ඇති පිළිතුරුවලට ලකුණු පවරන්න. )

ii) **ජේසුස් වහන්සේගේ පුනරුත්ථානය.**

◆ පළමුකොට සතියේ පළමුවන දින කාන්තාවන් විසින් ජේසුතුමාගේ මෘත දේහය සුවඳ තෙලින් අලේප කිරීමට පැමිණි අතර ජේසුතුමා උත්ථාන වූ බව අසන්නට ලැබුණි.

◆ එම්මාවුස් ගමට ගිය ගෝලයන් දෙදෙනාට ජේසුතුමාව දර්ශනයවීම.

◆ ශ්‍රාවකයන් ජෙරුසලමේ එක්ව කතා කරමින් සිටි විට දර්ශනයවීම.

◆ ''ඒකාන්තයෙන්ම සමිඳාණන් වහන්සේ නැගිට සිටින සේක'' යන වදන තුළින් උත්ථාන වූ ජේසුතුමා හඳුනාගන්නා ලදී.

◆ උන්වහන්සේ ජීවමාන බව විශ්වාසය අප තුළ තිබිය යුතු බව.

◆ උන් වහන්සේ අප බලාපොරොත්තු නොවන අවස්ථාවලදී අපට හමුවිය හැකි බව.

(10 ශ්‍රේණිය පෙළ පොතේ පිටු අංක 72, 73 ට අනුව ළමුන් ලියා ඇති පිළිතුරුවලට ලකුණු පවරන්න. )

iii) **සබත් දින දිය උදර රෝගියෙකු සුව කිරීම.**

◆ සබත් දිනයේ දී පරිසිවරයෙකුගේ නිවසේ දී මෙම දිය උදර රෝගියා සුවය ලැබීමට සිටියේ ය.

◆ ''සබත් දවසේ දී සුව කරන්නට යුතු ද? නැත්දැයි ව්‍යවස්ථාව උන්වහන්සේගෙන් හා පරිසිවරුන්ගෙන් ඇසූ සේක.

◆ නමුත් ජේසුතුමා ඔහුගේ අතින් අල්ලා සුවකර යැවූ සේක.

◆ ඊට ජේසුතුමා කී උපැහරණය '' සබත් දවසේ දී, නුඹලාගේ කවරෙකුගේවත් කොටළුවකු, ගොනෙකු සබත් දිනයේ දී ළිඳක වැටුණහොත් ඌ ගොඩට ගන්නේ නැත්දැයි ඇසූ සේක. ''

(10 ශ්‍රේණිය පෙළ පොතේ පිටු අංක 43, 43 ට අනුව ළමුන් ලියා ඇති පිළිතුරුවලට ලකුණු පවරන්න. )

iv) **ගෙත්සෙමන උයනේ යාච්ඤාව.**

◆ අන්තිම රාත්‍රී භෝජනයෙන් පසුව ජේසුස් වහන්සේ ඔලිව කන්දට තම ශ්‍රාවකයන් සමඟ නැගුණ සේක.

◆ තමන් වහන්සේ කරන්නට යන ජීවිත පූජාව ගැන වඩාත් ඕනෑකමින් යාච්ඤා කළ අතර, උන්වහන්සේගේ දහදිය බිංදු ලේ බිංදු මෙන් බිමට වැටුණු සේක.

◆ ''මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා '' ඔලිව කන්දෙහි යාච්ඤාවේ හරය විය.

◆ ''පරීක්ෂාවට නොවැටෙන පිණිස නැගිට යාච්ඤා කරන්න.'' යැයි ශ්‍රාවකයන්ට කී සේක.

◆ තම සිත් තැවුල මධ්‍යයේ පවා ගෝලයන්ට යාච්ඤා කිරීමට ධෛර්ය දුන් සේක.

(10 ශ්‍රේණිය පෙළ පොතේ පිටු අංක 57, 58 ට අනුව ළමුන් ලියා ඇති පිළිතුරුවලට ලකුණු පවරන්න. )